දෙපාර්තමේන්තු නියෝග 04/2025

මගේ අංකය: DAPH/AD/16/02/05/2024

සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව

පේරාදෙණිය

2025.06. 17

සියලුම අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්,

සියලුම අධ්‍යක්ෂවරුන්,

ප්‍රධාන ගණකාධිකාරී/ ප්‍රධාන අභ්‍යන්තර විගණක,

අංශ ප්‍රධානී (ඉංජිනේරු),

ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී (අධ්‍යක්ෂ ජනරාල් කාර්යාලය),

සියලුම රියදුරු මහතුන්

<u>ධාවන සටහන් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් උපදෙස් මාලාව.</u>

මෙම දෙපාර්තමේන්තුවේ වාහනවල ධාවන සටහන් ලිවීමේදී සිදුවන ගැටලු අවම කර, ධාවන සටහන් නිවැරදිව පවත්වාගෙන යාම සම්බන්ධයෙන් පහත සඳහන් උපදෙස් මාලාව නිකුත් කරමි.

i. පොදු 268 ආකෘති පත්‍රයෙහි (ධාවන සටහනෙහි) දක්වා ඇති සියලු කරුණු පැහැදිලි අත් අකුරින් ලිවිය යුතුය. දෛනික ධාවන සටහන් එක මත ලිවීම, නොපෙනෙන/ අපැහැදිලි කාබන් භාවිතය හා ටිපෙක්ස් දියර භාවිතා කිරීම නොකළ යුතුය.

ii. පොදු 268 ආකෘති පත්‍රයෙහි මයිලෝ මීටරයෙහි සඳහන් සැතැප්ම ගණන යන්න කිලෝමීටර් ලෙස සංශෝධනය කර ගත යුතුය.

iii. ඉන්ධන ලබා ගැනීමේදී මුදල, ප්‍රමාණය, බිල්පත් අංකය සහ දිනය නිවැරදිව සඳහන් කල යුතුය. එම තොරතුරු සාරාංශ සටහනෙහි නිවැරදිව දැක්විය යුතුය.

iv. ඉන්ධන ලබා ගැනීමේදී ඒ පිළිබඳව පොදු 268 ආකෘති පත්‍රයෙහි සටහන් කොට වාහන විෂයභාර නිලධාරියාගෙන් හෝ එදිනට ඉන්ධන ලබා ගැනීමට යන නිලධාරියාගෙන් අත්සන් ලබා ගත යුතුය.

v. වාහනය ධාවනය කල දුර ප්‍රමාණය ආදිය සටහන් කරනු ලබන සාරාංශ සටහනෙහි පසුගිය මාසයෙහි අන්තිමට මුලු වියදම නිවැරදිව සඳහන් කළ යුතුය.

vi. සාරාංශ සටහනෙහි මේ මාසේ ගිය වියදම යටතේ ඇති ඉන්ධන හා තෙල් වියදම යටතට එම මාසයේ දැවුණු ඉන්ධන ප්‍රමාණය, එම මාසයට අදාල ඉන්ධන මිලෙන් ගුණ කර දැක්විය යුතුය.

vii. සාරාංශ සටහනෙහි වාහනය භාර නිලධාරියාගේ අත්සන යටතේ පරිපාලන නිලධාරිනියගේ අත්සනද, දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන යටතේ අධ්‍යක්ෂ (පරිපාලන) ගේ අත්සනද යෙදිය යුතුය.

viii. මාසික සාරාංශ, පෙර මාසයේ සාරාංශ සමඟ සසඳා පිරිවැය වාර්තාව පරීක්ෂා කර විගණනයට ඉදිරිපත් කිරීම සඳහා සෑම මසකම 10 දිනට පෙර විෂය නිලධාරී වෙත භාර දීමට කටයුතු කළ යුතුය.

ix. වාර සේවාවන් හා අලුත්වැඩියාවන් පිළිබඳ නිසිලෙස සටහන් යෙදීම, මයිලෝ මීටරය ක්‍රියාවිරහිත වූ විට අවශ්‍ය සටහන් යෙදීම, දළ දුර ප්‍රමාණයන් සටහන් කිරීම හා කඩිනමින් අලුත්වැඩියාවන් සිදුකරවා ගැනීම සිදු කළ යුතුය.

x. වාහන කිහිපයක රියදුරන් ලෙස කටයුතු කරන විට එක් එක් වාහනය සඳහා වෙන වෙනම දෛනික ධාවන සටහන් පවත්වාගෙන යා යුතුය.

xi. දෛනික ධාවන සටහන් පොත අවසන් වූ පසු විෂයභාර නිලධාරියාට සාධාරණ කාලයක් තුල එය භාර දීමට කටයුතු කළ යුතුය.

xii. ඉන්ධන ලබාගැනීමේදී පූර්ණ ඉන්ධන ලීටර් අනුව ලබා ගැනීමට කටයුතු කළ යුතුය.


ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව
තැ.පෙ. 13, ගැටඹේ
පේරාදෙණිය

ආචාර්ය කේ.ඒ.සී.එච්.ඒ. කොතලාවල
අධ්‍යක්ෂ ජනරාල්
සත්ත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්තමේන්තුව


පිටපත් :

1. ලේකම්, කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය - කා.දැ.ගැ.ස.
2. විගණකාධිපති - කා.දැ.ගැ.ස.
3. AD/17 විෂය නිලධාරී - ඉහත උපදෙස් අනුව කටයුතු කිරීම සඳහා